# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 14
NUMBER 04

✻ ✻ ✻ ✻ ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත ✻ ✻ ✻ ✻
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

JULY 10, 2011 ජූලි මාසය (බුද්ධ වර්ෂ 2555 ඇසළ මාසය)    http://www.lankaheritage.com/lankaviththi/


# අපේ ප්‍රශ්න විසඳුමට ඇති අපේ අයිතිය...

♦ සංජය විමලරත්න විසිනි

## මොකක්ද ජාතික ප්‍රශ්නය ?

ඊනියා ජාතික ප්‍රශ්නයක් ගැන දැන් ලංකාවේ නැවත කතාකරන්නට පටන්ගෙන ඇත. මේ ජාතික ප්‍රශ්නය නමැති මාතෘකාව සමහර දේශපාලන පක්ෂ කතාකරන්නට දෙයක් නැතිවූ විට තම බංකොලොත්කම වසාගන්නට මතුකර ගෙන පාපන්දුවක් ලෙස ඒ මේ අතට පයින් දමා ගැසීම සිරිතක් කරගනිති.

ලංකාවේ ජාතික ප්‍රශ්න එකක් නොව ගණනාවක්ම ඇත. ඒවා අතර ජීවන වියදම, විරැකියාව, දූෂණය, සෞඛ්‍ය තත්වය කඩාවැටීම, බෝවන රෝග, ජනතාව වකුගඩු රෝගයෙන් දහස් ගණන් මියයාම, ඩෙංගු උවදුර, මත්ද්‍රව්‍ය භාවිතය ආදී බොහෝ කාරණා ජාතික ප්‍රශ්න වෙති. මන්ද ඒ සියල්ල මුළුමහත් ලංකාවේ ජනතාවටම බලපාන නිසාය. සමස්ත ලංකාව එක ජාතියක් ලෙස ගත්විට ඊට බලපාන යමක් වෙද ජාතික ප්‍රශ්නයක් වන්නේ එයයි. ඒවාට ප්‍රතිකර්ම සොයාගත යුතුය. ඒවා විසඳිය යුතුය. පහුගිය කාලයේ එනම් දශක තුනක්ම කොටි ත්‍රස්තවාදය අපට තිබූ විශාලතම ජාතික ප්‍රශනය වූයේය. එය මනාසේ විසඳාගන්නට අපට හැකි විය. ජාතික ප්‍රශ්නය යනු කුමක්දැයි වටහා ගන්නට එයම ප්‍රමාණවත් ය.

ජාතික ප්‍රශ්නය යන වචන දෙක උච්චාරණය කළවිට ඉන් ඇසෙන දේ වැරදි ලෙස කෙනෙකු වටහා ගන්නට පුළුවන. මක්නි සාද එය බොහෝ විට වාර්ගික ප්‍රශ්නයක් ලෙස ද තේරුම් දෙන නිසාය. ලංකාව එක ජාතියක් ලෙස සිතා කටයුතු කරන අය ජාතික ප්‍රශ්නයක් යයි කී විට සිතන්නේ සිංහළ, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී සියළුම ජන කොටස්වලට පොදු වූ, ඔවුන් සියල්ලන්ටම බලපාන ප්‍රශ්නයක්, ගැටළුවක් ලෙසය. එහෙත් බෙදුම් වාදය හිතේ ඇති දෙමළ ජාතිකයෙකුට ජාතික ප්‍රශ්නය යනු දෙමළ ජනතාවට පමණක් බලපාන ප්‍රශ්නයකි. අවුරුදු තිහක්ම කොටි සංවිධානයට තිබුණු ජාතික ප්‍රශ්නය දෙමළ ජනතාව වෙනුවෙන් විශේෂිත ඊළම් රාජ්‍යයක් ගොඩනගා ගැනීමය. අද ලංකාවෙන් පිටත සිටින දෙමළ ඩයස්පෝරාව සහ තමිල්නාඩුවේ දෙමළ දේශපාලකයන්ද කතාකරන ශ්‍රීලංකාවේ ජාතික ප්‍රශ්නය වූ කලී ප්‍රභාකරන් සිතූ ජාතික ප්‍රශ්නය ම ය. එනම් ලංකාවේ දෙමළ ජනයා වෙනුවෙන් විසඳිය යුතු ප්‍රශ්නයකි. ඒනිසා මේ ලිපියේ මුලින් සඳහන් කළ රටට පොදු ප්‍රශ්න ඔවුන්ට ජාතික ප්‍රශ්න නොවේ. ජාතික ප්‍රශ්නය නම් ඊළමකින්ම හෝ එයට සමාන බෙදීමකින් හෝ ඉටුවිය යුතු, විසඳිය යුතු ප්‍රශ්නයක්මය. අන් කිසි පිළියමක් හරියන්නේ නැත.

## දෙමළ ජාතික ප්‍රශ්නයේ උපත


දෙමළ බෙදුම්වාදයේ නිර්මාතෘ මියගිය එස්. ජේ. වී. චෙල්වනායගම්ය. 1949 දී ඔහු මූලිකව පිහිටවූ දේශපාලන පක්ෂය තමිල් අරසු කච්චි හෙවත් දෙමළ රාජ්‍ය පක්ෂය නම් වේ. ඔහු එය ඉංග්‍රීසියෙන් හැඳින් වූයේ **Federal Party** යනුවෙනි. දෙමළ ජනයාට වෙනම රාජ්‍යයක් ලංකාවේ අවශ්‍යය යන අදහස මුලින්ම ඔහු ඉදිරිපත් කළේ එම පක්ෂය පිහිටවූ දවසේය. ඒ පක්ෂයේ නමෙන්ම එය පැහැදිලි වේ. එතැන් පටන් ලංකාව බෙදා වෙන් කළ යුතුය යන විෂම අදහස උතුරේ දෙමළ ජනතාවට ඔහු කා වැද්දුවේය. එම බෙදුම්වාදී සංකල්පය ක්‍රියාවට නගා ඉෂ්ටකර ගැන්මට ඉදිරිපත් වූ වේලුපිල්ලේ ප්‍රභාකරන් අවුරුදු 30 ක් පුරා ශ්‍රීලංකාව වැනසුවේය. එහි භයානක කම කොපමණද දැයි කිව යුතු නැත. එය මුළු මහත් ලෝකයම අද දනී.

## ඉන්දියාවේ මැදිහත්වීම

ශ්‍රීලංකාවේ දෙමළ ජනයා සමග ලංකාවේ ඇතිවන සෑම ප්‍රශ්නයකදීම ඉන්දියාවේ තමිල් නාඩු දේශපාලකයෝ ලංකාවට පහර ගසන්නට පටන්ගනිති. අපේ රටේ වාර්ගික ප්‍රශ්නය තමිල් නාඩුවේ දේශපාලනයට හැම විටම මාතෘකාවක් කරගන්නා බව අප දැක ඇත. ලංකාවේ ද දෙමළ දේශපාලකයෝ විශේෂයෙන් දෙමළ ජාතික සංවිධානය ද ඒ තත්වය තම ප්‍රයෝජනයට ගන්නට දනිති. දැන් එය ඔවුන්ගේ ස්වාභාවික ගතිය බවට පත්වී තිබේ. දෙමළ ජාතික සංධානයේ මන්ත්‍රී වරු ඉතා සුළු දේකට පවා තමිල් නාඩුවට දුවගොස් කරුණානිධි හෝ ජයලලිතා හෝ වයිකෝගෙන් හෝ උපදෙස් ලබාගෙන එති. එහෙත් මේ **TNA** කාරයින් ජීවත්වන්නේ ලංකාවේය. ලංකා පාර්ලිමේන්තු වරප්‍රසාද භුක්ති විඳින අතරේ උන් උපදෙස් ගන්නේ තමිල්නාඩුවේ සිටින ලංකාවිරෝධී සිංහල විරෝධී දේස පාලුවන්ගෙන්ය. ආනන්ද සංගරී පවා දැන් ක්‍රියාකරන්නේ තමිල්නාඩුවට අවශ්‍ය පරිදිය.

නමුත් තමිල් නාඩුවේ සාමාන්‍ය දුප්පත් ඡන්දදායකයා නොදන්නා කරුණයක් වෙයි. එනම් තමිල්නාඩුවට දුවගෙන එන ලංකාවේ උතුරේ දෙමළ දේසපාලුවන් කිසිවෙක් උඩරට වතු කම්කරුවන් වෙනුවෙන් සටන් වදින්නේ හෝ කෑමොර ගහන්නේ නැති බවය. එසේම ඉන්දියාවෙන් ආ උඩරට වතුකම්කරු ද්‍රවිඩ ජනතාව කිසිවිටක ත්‍රස්තවාදී ක්‍රියාවන්ට සහභාගි වී නැති බවත්, ඔවුන් ඇද ගන්නට කොටි සංවිධානයට නොහැකිවූ බවත්, ඔවුන්ගේ නියෝජිත උඩරට වතුකම්කරු සංගම් හා ඒ දෙමළ දේශපාලකයින් හැමවිටම ලංකාවේ මහ ආණ්ඩුව හා සහයෝගයෙන් කටයුතු කරන බවත් කිසිවෙකු තමිල්නාඩුවේ දෙමළ ජනතාවට මෙතෙක් පැහැදිලි කර දී නැත.

4 වන පිටුවට ⟶



දුර ඇවිදිනු නොහැකි මා ඔබෙ කරින් ගෙන
බර අඩි තබා නිහඬව සීරුවෙන් යන
දැර දැඬු පියෙකු ලෙස පෙනුණත් නොහික් මුණ
පුර වා සෙනෙහෙ ඇත ඔබ මට නොපෙන් වන

නෙක ලොව පුදුම ඔබෙ දෑසින් බලන් නට
ටි ක ටික පුරුදුවෙමි මහ කඳු නගින් නට
දැ ක මගෙ තරුණකම හසරැළි නගන් නට
හෙට ඔබ නොමැතිවෙද, බියවෙමි සිතන් නට

**Carrying me on the shoulder for I cannot walk,**
**And moving on quietly with careful heavy steps**
**The world might see you as a rough, boorish dad**
**Yet I know the hidden affection you always had**

**Seeing the marvels of the world through your eyes**
**Slowly I will learn to climb mountains with ease**
**To see me grown up to a man like all other men**
**I dread to think that you wouldn't be there then**

♦ *දයා ආනන්ද රණසිංහ*   ♦ *Daya Ananda Ranasinghe*

**Above Painting by**
**Iman Maleki**
**ඉහළ චිත්‍රය**
ඉරානයේ තරුණ චිත්‍රශිල්පි
**ඉමාන් මලේකි**

**Iman Maleki** was born in Teheran in 1976. He graduated in Graphic Design from the Art University of Teheran.
Since 1998, he has participated in several international exhibitions. Now he teaches painting in his country and has setup his own art studio there.






විස්තර පිටු අංක 3